# පංච ධන සූත්‍රය

(අං.නි. 3, බු.ජ.ත්‍රි. 82 පිට)

ජීවිතයේ සැබෑ සතුට සැනසුම උදා කර ලන ධනයන් පහක් පිළිබඳ දක්වෙන මෙම සූත්‍රය අංගුත්තර නිකායෙහි පංචක නිපාතයෙහි ඇතුළත් වන්නකි. ධනයකින් අප ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ ජීවිතයේ දුක් කම්කටොලු දුරලා සතුට සැනසුම අඛණ්ඩව පවත්වා ගැනීමයි. එකී අභිලාශය ඇතිව අප ජීවිතය තුළ මිලමුදල්, ඉඩම්කඩම්, ගේදොර, දූදරුවන්, අධ්‍යාපනය, රැකීරක්ෂා, රූප සම්පත්තිය, කායික නීරෝගීබව, කීර්තිය යනාදිය ගොඩනගා ගැනීමට අඛණ්ඩ උත්සාහයක නිරත වන්නෙමු. ඒ සඳහා තම කාලය, ශ්‍රමය, බුද්ධිය උපරිම ලෙස කැප කරන්නෙමු. මෙම ධනයන් අප ජීවිතය සඵල කර ගැනීම සඳහා කිසියම් පමණකට උපකාරී වේ. එබැවින් එම ධනයන් අත්ථි සුඛ වශයෙන් බුදුදහමින් අගය කොට තිබේ. මෙම ධනයන් ථාවර නිධාන, ජංගම නිධාන, අංගසම නිධාන වශයෙන් ද දක්වා ඇත. එම ධනය දැහැමිව උපයන ලෙස බුදුදහමින් අනුශාසනා කර තිබේ. මෙලෙස උපයන ධනය කලකදී සැපත සම්පත උදාකර දෙන අතර තවත් කලකදී ඒවා ම දුක - විපත පිණිස ද හේතු වේ. ඒ අතර ඒවා ඕනෑම මොහොතක විනාශ වීමට හෝ තමාට අහිමි වීමට ද පුළුවන. මරණින් මතු ඒවා නිසැකවම තමාට අහිමි වේ. භෞතික වශයෙන් ගොඩනගා ගන්නා ධනයේ පවත්නා මෙම යථාර්ථය අප නුවණින් සිහි කළ යුතුව පවතී. එමගින් වඩාත් ම අර්ථවත්, දිගුකාලීන ධනයන් අප ජීවිතය තුළ රැස් කර ගැනීමට උත්සුක වනු ඇත.

මෙබඳු තත්ත්වයක් මත මහා කාරුණාවෙන් හා මහා ප්‍රඥාවෙන් හෙබි භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ සැබෑ ධනයන් කුමක්දැයි අපට පැහැදිලි කර දේ. ඒ අනුව උන් වහන්සේ ධනයක් පහක් ඉදිරිපත් කරති. එනම්

***'පඤ්චිමානි භික්ඛවේ ධනානි කතමානි පඤ්ච? සද්ධාධනං, සීලධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනං.'***

1. ශ්‍රද්ධා ධනය
2. ශීල ධනය
3. ශ්‍රැත ධනය
4. ත්‍යාග ධනය
5. ප්‍රඥා ධනය

මෙම ධනයන්හි පවත්නා විශේෂත්වය නම් ඒවා කිසි කලෙකත් දුක, වේදනාව පිණිස නොපවතින අතර එමගින් ලැබෙන මානසික තෘප්තිය කිසි කලෙකත් අඩු නොවී එය ක්‍රමයෙන් වැඩි වෙමින් පැවතීමයි. ජීවත් වන කාලයෙහි දී ඒවා සතුට සැනසුම පිණිස හේතු වෙනවා පමණක් නොව මරණින් මතු අනුගාමික නිධාන වශයෙන් ඒවා තමා පිටුපස සෙවණැල්ලක් මෙන් ගමන් කරමින් සසර දී සැප සතුට යහපත උදා කර දේ. මෙම ධනය තම මනස, සිත අලංකාර කරන්නක් වශයෙන් ද සඳහන් ව තිබේ. එය සැබෑ සතුට ලැබෙන මාවත වශයෙන් දක්වේ.

**ශ්‍රද්ධාව** යනු බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන කෙරෙහි පවත්නා පැහැදීමයි. ප්‍රසන්න සහගත හැඟීමයි. මෙය ධනයක් වන්නේ බුදුරදුන්ගේ අවබෝධය, ධර්මයෙන් ස්වාක්ඛාතාදි ලක්ෂණ, ආර්ය මහා සංඝ රත්නයේ සුපටිපන්නාදි සගගුණ සිතන මොහොතක් පාසා සිතෙහි අපමණ සතුටක් සොම්නසක් ප්‍රබෝධයක් හට ගැනීමයි.

**ශීල** යනු තම කායික - වාචසික සංවරයයි. තමාගේ කයින් හා වචනයෙන් ප්‍රාණඝාතය, සොරකම, කාම මිථ්‍යාචාරය, බොරු කීම, කේලාම් කීම, එරුෂ වචන හා හිස්වචනයෙන් වෙන් වූ පමණට තමාගේ චරිතය ගැන

සිතෙන වාරයක් පාසා තමාට මහත් වූ සතුටක් හටගනී. එමෙන් ම තම කය වචනය මෙහෙයවා කළ යහපත ගැන සිතීමේ දී මෙම සතුට තවදුරටත් වර්ධනය වේ.

**ශ්‍රැත** යනු ඇසූ පිරූ තැන් ඇති බවයි. එනම් ලෝකය හා තමා ගැන පවත්නා නිවැරදි වූත් සත්‍යවූත් දැනුවත් බවයි. මෙහිලා බුදුදහම විශේෂයෙන් අවධාරණය කරන්නේ කර්මය හා කර්මඵල පිළිබඳවත් හේතුඵල දහම (*පටිච්ච සමුප්පාද*) පිළිබඳවත් පවත්නා දැනුවත් බවයි. මෙම දැනුම ධනයක් වන්නේ තම මානසික ප්‍රශ්න පැනනැගීමේ දී ඒවා ධර්මානුකූලව විසඳා ගැනීමට මෙමගින් හැකියාව ලැබීම නිසාවෙනි. තම ජීවිත අභියෝගවලදී මහා පහන් ටැඹක් සේ මෙම දැනුම තමාට ආලෝකය සපයයි. ශ්‍රැතවත් බව පර්යාප්ති ප්‍රතිපත්ති දෙකට පදනම වේ.

**ත්‍යාග** යනු අත් හැරීමයි. එනම් තමා සතු දෑ ලෝකයේ යහපත උදෙසා පරිත්‍යාග කිරීමයි. ආමිස දාන, අභය දාන, ධර්ම දාන වශයෙන් ලොවට දෙන දානය නිසා තම සිතෙහි පවත්නා මසුරු මල දුරුවීමෙන් සිතෙහි සැහැල්ලුව සතුට වර්ධනය වේ. තමා මහන්සියෙන් දැහැමිව උපයා ගත් ධනයෙන් තම මව්පියන්ට, ඥාතීන්ට, අසරණයන්ට, සමාජ ප්‍රගමනයට මෙන් ම පූජනීය උතුමන්ට පරිත්‍යාග කරන විට තම සිතෙහි අපමණ සතුටක් හටගනී. දන් දෙන තැනැත්තා උදාර වූ සතුටක් භුක්තිවිඳින බව සඳහන් වන්නේ එබැවිනි (*පීතිමුදාරං වින්දති දාතා*).

**ප්‍රඥා** ධනය යනු සිත හා කය  සම්බන්ධ සියලු අත්දැකීම්වල හටගැනීම හා නිරුද්ධවීම හෙවත් අනිත්‍යතාව පිළිබඳ දැනුමින් යුතු පටිච්ච සමුප්පාදය පිළිබඳ අවබෝධයයි. හැම මොහොතක ම සිදුවන පංච උපාදානස්කන්ධයේ හටගැනීම හා නිරුද්ධවීම පිළිබඳ වැටහීම ලද පමණට ලෝකය කෙරෙහි ඇලීම දුරුවන අතර එමපණට ගැටීම ද දුරුවී දුකින් නිදහස්වීමේ අවකාශ සැලසේ. මෙම ප්‍රඥාව මිනිසාට මැණිකක් ලෙස සඳහන් ව තිබේ (*පඤ්ඤා නරානං රතනං*). මෙම ප්‍රඥාවෙන් තම මානසික පාරිශුද්ධිය ඇති කරයි (*පඤ්ඤාය පරිසුජ්ඣති*). තම සිතෙහි හටගන්නා දුක් නමැති අඳුර දුරුලීමට මෙම ප්‍රඥාවට සම කළ හැකි ආලෝකයක් නොමැති (*නත්ථි පඤ්ඤා සමා ආභා*) බව දක්වේ.

මෙම ධනයන් පහෙන් පොහොසත් වූ පමණට සිතෙහි පවත්නා දුක් කම්කටොළු දුරු වී වඩාත් සතුටින් ජීවත් වීමට අවස්ථාව උදාවේ. ඊට හේතුව මෙම ධනයන්ගෙන් යුක්ත වූ පමණට තමාගේ සිතෙහි කුශල ශක්තිය ප්‍රබල වී තමාට කුශල ආනිසංස ලැබෙන අතර අතීත කර්ම ශක්ති වශයෙන් එළඹෙන අකුශල කර්ම ශක්තීන් දුර්වල කර ගැනීමට ද මෙමගින් හැකියාව ලැබේ. ඒ අතර අනිත්‍යතාව ප්‍රත්‍යක්ෂයෙන් ලෙඩවීම, මහලුවීම, මරණය, ප්‍රිය විප්‍රයෝග යන ජීවිත අභියෝග හමුවෙහි නොසැලී සිටීමේ මානසික ශක්තිය ද ක්‍රමයෙන් වර්ධනය වේ.

ශ්‍රද්ධාදී ධනයන් පිළිබඳව සිතෙන වාරයක් පාසා සිතෙහි අපමණ සතුටක් ජනිත වන අතර එම සතුට කිසිවෙකුට පැහැර ගැනීමට නොහැකි අතර තමා මහලු බවට පත් වෙත් ම එම සතුට ක්‍රමයෙන් වර්ධනය වේ. බාහිර ලෝකය පිළිබඳව විශ්වාසය තබා රැස්කළ සියලු ධනය තමාට පාලනය කළ නොහැකි බැවින් තමා කැමැති ලෙස පවත්වා ගත නොහැකි අතර ශ්‍රද්ධාදි අනුගාමික නිධාන තමා කැමැති ලෙස පවත්වා ගනිමින් තමාගේ මෙලොව හා පරලොව සැබෑ අභිවෘද්ධිය සඳහා ඒවා යොදා ගැනීමේ හැකියාව ද පවතී. එබැවින් මෙම ධනයෙන් හැකිතාක් පොහොසත් වන ලෙස භාග්‍යවතුන් වහන්සේ අපට අනුශාසනා කරති. කිසිවෙකුටත් පැහැර ගත නොහැකි තමා අත නොහැර යන සැබෑ ධනය වන මෙය උතුම් ම ධනය වන අතර එය ආර්ය උතුමන්ගේ වර්ණනාවට ලක් වී ඇති බැවින් ඒවා ආර්ය ධන නමින් ද අනුගාමික නිධාන වශයෙන් ද හැඳින්වේ.